# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2019.04.25

වේලාව : පෙ.ව. 9.30

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත.

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :**

| | | | |
|---|---|---|---|
| **1)** | **ප්‍රදීප් යසරත්න මහතා** | **-** | **ප්‍රධාන ලේකම් (බ.ප)** |
| **2)** | **පී. සෝමසිරි මහතා** | **-** | **ආණ්ඩුකාර ලේකම්** |
| **3)** | **චන්ද්‍රානි සමරකෝන් මිය** | **-** | **ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)** |
| **4)** | **එන්.නිල්වල මහතා** | **-** | **ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප)** |
| **5)** | **කේ. චම්පාඑන්. පෙරේරා මිය** | **-** | **ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය (බ.ප)** |
| **6)** | **එච්.ජී.ජී.ජේ.ධර්මසේන මහතා** | **-** | **ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප)** |
| **7)** | **ඩබ්ලිව්.එම්.දයාවතී මිය** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)** |
| **8)** | **එන්.බන්දුල ප්‍රේමකුමාර මහතා** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)** |
| **9)** | **ඩබ්ලිව්.එම්.ඩී.එන්.රණසිංහ මහතා** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)** |
| **10)** | **පී.කණිෂ්ක ශ්‍රීලාල් මහතා** | **-** | **සහකාර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප)** |
| **11)** | **ජේෂලාආර්. අබේසූරියමිය** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)** |
| **12)** | **කේ.එන්.සූරියආරච්චි මිය** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)** |
| **13)** | **කේ.ඩී.වයි.බිමාලි මිය** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)** |
| **14)** | **ඒ.පී.පී.අබේසේකර මිය** | **-** | **සහකාර අධ්‍යක්ෂ(සැලසුම්)** |
| **15)** | **පාලිතඅබේවර්ධන මහතා** | **-** | **ප්‍රධාන නීති නිලධාරි** |
| **16)** | **එස්.එච්.ඒ.එන්.නෙලුම්මලී මිය** | **-** | **පරිපාලන නිලධාරී, සභා ලේකම් කාර්යාලය (බ.ප)** |

**ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ටඑළඹෙන ලදී.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | පළාත් සහා නව ගොඩනැගිල්ලේ ස්ථාපිත සියලු ආයතන සඳහා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම සම්බන්ධව | නව පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත සියලු ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම් පිලිබඳ ව ප්‍රධාන ලේකම් විසින් ප්‍රගතිය විමසන ලදී.<br><br>එහි දී බොහෝ ආයතන විසින් අවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීම් සිදු කර ඇති බවත්, ප්‍රවාහන අමාත්‍යාංශය මෙම සති 2 ඇතුළත භාණ්ඩ ලැබීමට නියමිතව ඇති බවත්,සාකච්ඡා විය.<br><br>පළාත් පාලන දෙපාර්තමේන්තුවේ තවමත් මිල දී ගැනීම් සිදු නොවීමට හේතුව,එම දෙපාර්තමේන්තුවේගණකාධිකාරීවරියගෙන් විමසූ අතර, මැයිමස 20 දිනට පෙරඅදාල මිලදී ගැනීම් සිදු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>ප්‍රධාන ලේකම් කාර්යාලයේකළමනාකරණ සහකාර පුටු 350 මැයි මස 30න් පසුව ලැබීමට නියමිත බවත්, නව ශ්‍රවණාගාරයේ පුටු300මේ වන විට ලැබී ඇති බැවින්, මැයිමස 03 දින වන විට පුටු සවි කර දීමට හැකි බව නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින්ප්‍රධාන ලේකම් වෙතදන්වන ලදී. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය<br><br>ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 02. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ආපන ශාලාවේ කටයුතු පවත්වාගෙන යාම | ආපන ශාලාව පවත්වාගෙන යාම සඳහා වන ආහාර පාන කමිටුව සතියේ සෑම බදාදා දිනකම රැස් වන අතර, ඒ සම්බන්ධ යෝජනා හා පැමිණිලි වෙතොත් ආහාර පාන කමිටුව වෙත භාර දෙන මෙන් ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br><br>එසේම, කෘෂිකර්ම අමාත්‍යාංශයේවෙළෙඳ කුටියස්ථිරව ස්ථාපිත කරන ලෙසත්, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබූ දේශීය ආහාර කුටිය ප්‍රමිතිකරණයකරනැවතත් ආරම්භ කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br><br>එසේම, පලතුරු බිම හල මැයි මස 02 දින ආරම්භ කිරීමට නියමිත බවත් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින්ප්‍රධාන ලේකම් වෙතදන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) ප්‍රමුඛ ආහාර පාන කමිටුවේ සාමාජිකයින් |
| 03. | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේගාස්තු අඩු කිරීම සම්බන්ධව | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේගාස්තු අඩු කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇති පරිදි බස්නාහිර පළාතේ ව්‍යාපාර නාම ලියාපදිංචියේ දී අය කරනු ලබනගාස්තු අඩු කිරීම සඳහාඅදාල ප්‍රඥප්තිය සංශෝධනය කරන ලද ගැසට් නිවේදනය පිළිබඳව වර්තමාන ප්‍රගතිය ප්‍රධාන ලේකම් විසින් විමසන ලදී.<br><br>මේ සම්බන්ධයෙන්වර්තමාන තත්ත්වයප්‍රධාන ලේකම් වෙත වාර්තා කරන ලෙස වැඩිදුරටත් දන්වන ලදී. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 04. | නව ගොඩනැගිල්ල සඳහා වෛද්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම | පැරණි පළාත් සභා ගොඩනැගිල්ලේ පුස්තකාලයවෙනුවෙන් භාවිතා කරන ලද කාමරයභාවිතා කර, කඩිනමින් වෛද්‍ය මධ්‍යස්ථානය ආරම්භකිරීමට තීරණය කරන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 05. | ISO 9001-2015 තත්ත්ව සහතිකය | ප්‍රධාන ලේකම් කාර්යාලය ISO 9001-2015 තත්ත්ව සහතිකයලැබීමත් සමඟ එහි ලිපි ශීර්ෂ වලට ප්‍රමිති ලාංඡනය ඇතුළත් කර,ආදර්ශ ලිපි ශීර්ෂ ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කර, අනුමැතිය ලබා ගන්නා ලෙස දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය |
| 06. | "පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි මහජන සෞඛ්‍ය සේවා විධිමත් කිරීම සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ කමිටුව පළාත තුල සෞඛ්‍ය ආයතන සඳහා භෞතික සම්පත් වැඩිදියුණු කිරීමේ දී මතු වී ඇති ගැටළු" මැයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් යොමු කරන ලද WPH/A12/MC/04 හා 2019.03.18 දිනැති ලිපිය | මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්,දිස්ත්‍රික්ක 03හි සහකාර පළාත් පාලන කොමසාරිස්වරු, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,දිස්ත්‍රික්ක 03හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුසමඟ ප්‍රධාන ලේකම් සහභාගී වන රැස්වීමක් සූදානම් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 07. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය සඳහා හදිසි විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීම | මේ සඳහා කමිටුවක් පත් කර ඇති බැවින්, අදාලකමිටුවරැස් වී කඩිනමින් වාර්තාව ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. | කමිටු සභාපති ආණ්ඩුකාර ලේකම් |

## <u>නව යෝජනා</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් ආරක්ෂක කමිටුව | වර්තමානයේ ඇති වී තිබෙන අනපේක්ෂිත අර්බුදකාරී තත්ත්වය මත රාජ්‍ය ආයතන, පොදුස්ථාන හා මහජනයා ගැවසෙන ස්ථාන පිළිබඳව දැඩි ආරක්ෂක විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 2019.04.22 දින පිහිටුවා ඇති ආරක්ෂක කමිටුව, 2019.04.24 දින රැස් වූ අතර, එහි වාර්තාව සකසා පළාත් සහා නව ගොඩනැගිල්ලේ සියලු ආයතන ප්‍රධානින් වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වනලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 02. | පාසල්වල සහ අධ්‍යාපන කාර්යාලවල ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාතේ සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත යොමු කරන ලද, පාසල්වල සහ අධ්‍යාපන කාර්යාලවල ආරක්ෂක කටයුතු වඩාත් හොඳින් හා විධිමත් ව පවත්වාගෙන යාම සඳහා අනුගමනය කළ යුතු කරුණු සම්බන්ධ ලිපිය පිළිබඳව ප්‍රධාන ලේකම් විසින් රැස්වීමේ සිටි සියලු නිලධාරීන් දැනුවත් කරන ලදී. | ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය |

<table>
<tr>
<td>03.</td>
<td>ජාතික ගීය සහ පළාත් ගීය සඳහා නිසි ගෞරව කිරීම</td>
<td>නව පළාත් සභා ගොඩනැගිල්ලේ දෛනික කටයුතු ආරම්භ කිරීමට පෙර පෙ.ව.8.30ට වාදනය කරනු ලබන ජාතික ගීය සහ පළාත් ගීතය සඳහා ඇතැම් නිලධාරීන්ගෞරව නොකිරීම සම්බන්ධව ප්‍රධාන ලේකම් සියලුම ආයතන ප්‍රධානින් වෙත යොමු කර ඇති CSWP/ADM/27-80/FI/03 අංක හා 2019.04.09 දිනැති ලිපිය සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් ලේකම්වරු දැනුවත් කරන ලදී.</td>
<td>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු.</td>
</tr>
<tr>
<td>04.</td>
<td>කාර්යාලීය ප්‍රයෝජනයට ගත් ජංගම දුරකථන සහනදායී මිලට ලබා ගැනීම</td>
<td>බස්නාහිර පළාත් සභාවේ ජංගම දුරකථන ලබා ගැනීමට හිමිකම් ලබන මාණ්ඩලික නිලධාරීන් වෙත පළාත් සභාව විසින් නිකුත් කරන ලද ජංගම දුරකථන දිගු කාලයක් භාවිතා කිරීමෙන් පසු නවීන පහසුකම් වලින් තොර වීම හා කාලීන වශයෙන් නොගැලපීම මත කාර්යාලීය කටයුතු සඳහා භාවිතා කළ නොහැකිවීම හේතුවෙන් එම ජංගම දුරකථන ඉවත් කිරීමේ දී ඒවා භාවිතා කරන ලද නිලධාරීන්ටම සහනදායී මිලකටලබාගැනීම සම්බන්ධව සාකච්ඡා විය.<br><br>එහි දී 2018.09.21 දිනැති ලේකම්වරුන්ගේ රැස්වීමේ දී ගනු ලැබූ තීරණ පහත පරිදි සංශෝධනය කර, එමඉල්ලීම ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීමටතීරණය කරන ලදී.<br><br>
<table>
<tr><th>දුරකතනයේ/iPad යන්ත්‍රයේආයු කාලය</th><th>අය කළ යුතු ප්‍රතිශතය</th></tr>
<tr><td>වසර 02කට වැඩි එහෙත් 03කට අඩු ස්ථාන මාරුවීමක දී හෝ විශ්‍රාම ගැන්වීමකදී</td><td>20%</td></tr>
<tr><td>වසර 03 කට වැඩි</td><td>10%</td></tr>
</table>
<br>එසේම, නිලධාරියා පළාත් සභාවේ සේවයට පැමිණ අවම වශයෙන් වසරක සේවා කාලයක් සපුරා තිබිය යුතුය.<br><br>ඉහත යෝජනාවෙන් ඉදිරිපත් කර ඇති ප්‍රතිශතයන් බස්නාහිර පළාත් සභාව මඟින් ජංගම දුරකථන ලබා දී ඇති නිලධාරීන් හා iPad ලබා දී ඇති අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අනුමත I ශ්‍රේණියේ තනතුරක්සඳහා පත් කර ඇති I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පමණක් අදාල කර ගැනීමට තීරණය විය.</td>
<td>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)</td>
</tr>
<tr>
<td>05.</td>
<td>සති අන්ත දින වලදී හෝ රජයේ නිවාඩු දිනයන් හි සේවයට වාර්තා කිරීම</td>
<td>සති අන්ත දින වලදී හෝ රජයේ නිවාඩු දිනයන් හි සේවයට වාර්තා කිරීමේ දී නිලධාරීන්ගේ නාම ලේඛනය ඊටපෙර දිනයේ පෙ.ව.10.00ට පෙර පාලන අංශය වෙතයොමු කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් සියලු ලේකම්වරුන් වෙත දන්වන ලදී.</td>
<td>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු.</td>
</tr>
</table>

| | | | |
|---|---|---|---|
| 06. | ආරක්ෂක විධි විධාන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් බස්නාහිර පළාත් සභාව සඳහාආරක්ෂක උපකරණ මිල දී ගැනීම. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ආරක්ෂාව තර කිරීම සඳහා පහත උපකරණ මිල දී ගැනීම සිදු කල යුතු බව නි.ප්‍ර.ලේ(ඉංජිනේරු) විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදී.<br>• මාර්ග බාධක - 10<br>• වාහන පරීක්ෂක කන්නාඩි - 6<br>• පරිලෝකන උපකරණ (Scanners) – 3<br>• ලෝහඅනාවරක(Metel Detectors) - 20<br><br>ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 07. | ගරු අමාත්‍යවරුන් විසින් භාවිතා කරන ලද වාහන සහ අනෙකුත් ඉන්වෙන්ට්‍රිගත උපකරණ සම්බන්ධව | ගරු අමාත්‍යවරුන් විසින් භාවිතා කරන ලද වාහන සහ අනෙකුත් ඉන්වෙන්ට්‍රිගත උපකරණ නැවත අදාල අමාත්‍යාංශ වෙත ලබා ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු. |

අත්/කළෙ: ප්‍රදීප් යසරත්න,

ප්‍රධාන ලේකම්,

ඩබ්ලිව්.එම්.දයාවති,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).